// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2036/28 - 2017 සැප්තැම්බර් මස 13 වැනි බදාදා - 2017.09.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (A) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

උතුරු පළාතේ පළාත් සභාවේ 2017 වර්ෂයේ අංක 03 දරන බණිජ ද්‍රව්‍ය ප්‍රඥප්තිය

උතුරු පළාතේ පළාත් සභාවේ 2017 වර්ෂයේ අංක 3 දරන බණිජ ද්‍රව්‍ය ප්‍රඥප්තිය, උතුරු පළාතේ පළාත් සභාව විසින් 2017 වර්ෂයේ මැයි මස 25 වැනි දින සම්මත කරනු ලැබූ බවත්, එම ප්‍රඥප්තිය සඳහා උතුරු පළාතේ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2017 වර්ෂයේ සැප්තැම්බර් මස 06 වැනි දින අනුමැතිය ලබා දී තිබෙන බවත් මෙමගින් දැනුවත් කරනු ලැබේ.

කේ. තෙයිවේන්ද්‍රම්,
ලේකම්,
සභා ලේකම් කාර්යාලය,
උතුරු පළාත් සභාව.

2017 සැප්තැම්බර් මස 11 වැනි දින,
සභා ලේකම් කාර්යාලය,
ඒ9 මාර්ගය,
කයිතඩි.

1A - PG 3690 - 27 (2017/09)
මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**සෑම තක්සේරු වර්ෂයකම සෑම කාර්තුවක් සම්බන්ධයෙන් යම් තැනැත්තෙකුගේ අදාළ පිරිවැටුම මත බනිජ ද්‍රව්‍ය බද්දක් පනවනු ලැබීම සඳහා ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මෙම ප්‍රඥප්තිය 2017 අංක 03 දරන බනිජ ද්‍රව්‍ය ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, මෙම ප්‍රඥප්තිය සඳහා උතුරු පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාදෙනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

බනිජ ද්‍රව්‍ය බද්ද පැනවීම.

2. මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුව, මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයේ සිට (මෙහි මින්මතු මෙම ප්‍රඥප්තියේ "අදාළ කාර්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන, සෑම තක්සේරු වර්ෂයක ම සෑම කාර්තුවක් සඳහා එම අදාළ කාර්තුවේ යම් තැනැත්තෙකුගේ අදාළ පිරිවැටුමේ සෑම කොටසක් සම්බන්ධයෙන් සියයට 0.5ක අනුප්‍රමාණයක වූ බනිජ ද්‍රව්‍ය බද්දක් සෑම තැනැත්තෙකුගෙන් අයකර ගනු ලැබිය යුතු ය.

බනිජ ද්‍රව්‍ය බද්ද අයකරනු ලැබිය යුතු බව.

3. 1. උතුරු පළාත තුළ බනිජ ද්‍රව්‍යය ව්‍යාපාරය කරගෙන යනු ලබන සෑම තැනැත්තකු ම මෙම ප්‍රඥප්තියේ විධිවිධාන සලස්වනු ලැබිය හැකි ආකාරයට බනිජ ද්‍රව්‍ය බද්ද ගෙවීමට යටත් විය යුතු ය.

2. මෙම ප්‍රඥප්තියේ කාර්ය සඳහා, "ව්‍යාපාරය" යන්නෙන් 1992 අංක 33 දරන පතල් සහ බනිජ ද්‍රව්‍ය පනතේ 28 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක අධිකාරිය යටතේ ලබාගත් බනිජ ද්‍රව්‍ය තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් අලෙවි කිරීම් අදහස් වේ.
බනිජ ද්‍රව්‍ය යනු මෙම ප්‍රඥප්තියේ අර්ථ නිරූපනයට අනුව තිබේ.

යම් තැනැත්තකු බනිජ ද්‍රව්‍ය බද්ද ගෙවීමට යටත් වන බවට සලකනු ලැබීම.

4. යම් තැනැත්තෙකු විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් බනිජ ද්‍රව්‍ය බද්දක් අයකර ගනු ලැබිය යුතු විට සහ එම ව්‍යාපාරයේ හිමිකාරත්වය වෙනස්වීමක් සිදු වී ඇති විට, 3 වන වගන්තියේ විධිවිධාන නොතකා එම ව්‍යාපාරයේ නව හිමිකරු විසින් එම හිමිකාරත්වය වෙනස් වූ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී එම ව්‍යාපාරයේ හිමිකරු වශයෙන් සිටි ලෙස සලකා බනිජ ද්‍රව්‍ය බද්ද එම නව හිමිකරුගෙන් අයකර ගත යුතු ය.

බනිජ ද්‍රව්‍ය බද්ද ගෙවීමෙන් නිදහස් කිරීම.

5. (1) අමාත්‍යවරයා විසින්, උතුරු පළාතේ ආර්ථික අභිවෘද්ධිය සඳහා අත්‍යවශ්‍ය වන බවට ඔහුගේ මතය වන නිශ්චිතව සඳහන් කරනු ලබන යම් තැනැත්තකු විසින් කර ගෙන යනු ලබන යම් බණිජ ද්‍රව්‍ය සම්බන්ධ ව්‍යාපාරයක් *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයක් මගින් බනිජ ද්‍රව්‍ය බද්ද ගෙවීමෙන් නිදහස් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන සෑම නියමයක් ම එය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දිනයේ සිට හෝ එම නියමයේ නිශ්චිතව සඳහන් කරනු ලබන යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු අතර, එම නියමය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දිනයේ සිට මාස තුනක් ඇතුළත එය උතුරු පළාත් සභාව වෙත ඉදිරිපත් කිරීම හෝ එම කාලසීමාව ඇතුළත උතුරු පළාත් සභාවේ රුස්වීමක් පවත්වනු නොලැබූ විට එම කාලසීමාව ඉකුත් වීමෙන් පසුව පවත්වනු ලබන පළමු රුස්වීමේ දී එම නියමය මෝසමක් මගින් අනුමත කිරීම කළ යුතු ය.

(3) උතුරු පළාත් සභාව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන යම් නියමයක් එම ප්‍රතික්ෂේප කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි එම ප්‍රතික්ෂේප කරනු ලබන දිනය වන තෙක් එම නියමයේ වලංගුභාවයට අගතියක් නොමැතිව අවලංගු කරන ලද බවට සලකනු ලැබිය යුතු අතර, එසේ එම නියමය අවලංගු කරන ලද බවට සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකළ යුතු ය.

පිරිවැටුම.

6. මෙම ප්‍රඥප්තියේ කාර්ය සඳහා යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් හා යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් "බනිජ ද්‍රව්‍ය බද්ද" යනු යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් ව්‍යාපාරයක කටයුතු අතරතුර දී, එම තක්සේරු වර්ෂය තුළ දී ඇතුළත් වූ සෑම ගනුදෙනුවක් මගින් සත්‍ය වශයෙන් ම ලැබුණු හෝ නොලැබුණු ලැබිය යුතු මුළු මුදල අදහස් වේ.

අයකර ගත හැකි බවට වන දැන්වීම.

7. යම් අදළ කාර්තුවක් සඳහා බනිජ ද්‍රව්‍ය බද්ද අයකර ගනු ලැබිය යුතු හෝ අයකර ගනු ලැබීමට ඉඩ ඇති සෑම තැනැත්තකු ම කොමසාරිස්වරයා අමතා යවනු ලබන ලිඛිත දැන්වීමක් මගින් එම අදළ කාර්තුවේ අවසන් මාසයේ පහළොස් වන දිනට පෙර එම අයකර ගනු ලැබිය යුතු බව හෝ අයකර ගනු ලැබීමට ඉඩ ඇති බව පිළිබඳව දැන්වීමක් කළ යුතු ය.

බනිජ ද්‍රව්‍ය බද්ද ගෙවනු ලැබිය යුතු දිනය.

8. යම් අදළ කාර්තුවක් සඳහා බනිජ ද්‍රව්‍ය බද්ද අයකරගනු ලැබිය යුතු යම් තැනැත්තකු විසින් එම තැනැත්තා පිළිබඳව යම් තක්සේරුකරුවකු විසින් කිසිදු තක්සේරු කිරීමක් කර නොතිබුණ ද, එය නොතකා එම බනිජ ද්‍රව්‍ය බද්ද එම අදළ කාර්තුව අවසාන වීමෙන් පසු ඊට ඉක්බිතිව ම වූ මාසයේ පහළොස් වන දින හෝ ඊට පෙර කොමසාරිස්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

9. යම් අදළ කාර්තුවක් සඳහා ඛනිජ ද්‍රව්‍ය බද්ද අයකරගනු ලැබිය යුතු සෑම තැනැත්තකු ම, තක්සේරුකරුවකු විසින් ඒ වෙනුවෙන් නියම කර තිබුණ ද හෝ නොතිබුණ ද එම අදළ කාර්තුව අවසන් වීමෙන් පසු ඊට ඉක්බිතිව ම වූ මාසයේ පහළොස් වන දින හෝ ඊට පෙර ඔහුගේ අදාළ පිරිවැටුම පිළිබඳව කොමසාරිස්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් විස්තර ඇතුළත් යම් ආකෘතියක වූ වාර්තාවක් තක්සේරුකරුවකු වෙත ඉදිරිපත් කළ යුතු ය. කොමසාරිස්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන වෙනත් යම් විස්තර ඇත්නම් එම විස්තර සහ ඛනිජ ද්‍රව්‍ය බද්ද ගණනය කිරීමේ පදනම එම වාර්තාවේ පෙන්නුම් කළ යුතු ය. වාර්තා ඉදිරිපත් කිරීම.

10. (1) යම් තක්සේරුකරුවකු විසින් ඔහුගේ මතය අනුව, යම් අදළ කාර්තුවක් සඳහා ඛනිජ ද්‍රව්‍ය බද්ද අයකර ගනු ලැබිය යුතු යම් තැනැත්තකු විසින් ඇතැම් අවස්ථාවල දී තක්සේරුකරු විසින් තක්සේරු කිරීම.

*(අ)* ඛනිජ ද්‍රව්‍ය බද්ද ගෙවා නොමැති විට; හෝ

*(ආ)* එම අදළ කාර්තුව සඳහා ඛනිජ ද්‍රව්‍ය බද්ද වශයෙන් එම තැනැත්තා විසින් ගෙවිය යුතු නියමිත මුදලට වඩා අඩු මුදලක් ගෙවා ඇති විට, තක්සේරුකරු විසින් ඔහුගේ මතය අනුව එම අදාළ කාර්තුව සඳහා ඛනිජ ද්‍රව්‍ය බද්ද වශයෙන් එම තැනැත්තා විසින් ගෙවිය යුතු මුදල තක්සේරු කළ හැකි අතර එම තැනැත්තා වෙත ලිඛිතව යවනු ලබන දැන්වීමක් මගින් පහත සඳහන් දෑ-

(i) එම අදළ කාර්තුව සඳහා කිසිදු ඛනිජ ද්‍රව්‍ය බද්දක් එම තැනැත්තා විසින් ගෙවා නොමැති විට අදළ කාර්තුව සඳහා එසේ තක්සේරු කරන ලද ඛනිජ ද්‍රව්‍ය බදු මුදල; හෝ

(ii) එම අදළ කාර්තුව සඳහා යම් මුදලක් එම තැනැත්තා විසින් ඛනිජ ද්‍රව්‍ය බද්ද වශයෙන් ගෙවා ඇති විට, අදළ කාර්තුව සඳහා එම තැනැත්තා විසින් ඛනිජ ද්‍රව්‍ය බද්ද ලෙස සත්‍ය වශයෙන් ගෙවන ලද මුදල සහ එම අදළ කාර්තුව සඳහා ඛනිජ ද්‍රව්‍ය බද්ද වශයෙන් එසේ තක්සේරු කරන ලද මුදල අතර වෙනස,

වහාම ගෙවන ලෙස එම තැනැත්තාට නියම කළ යුතු ය.

(2) තක්සේරුකරුවකු හෝ බලයලත් තැනැත්තකු කැණීම් සිදු කරන ලද ස්ථානය පරීක්ෂා කර පිරිවැටුම පිළිබඳ වාර්තාව ඇගයීමේ අයිතිය තිබිය යුතු ය.

11. ඛනිජ ද්‍රව්‍ය බද්ද අයකර ගනු ලැබිය යුතු සෑම තැනැත්තකු ම එම තැනැත්තා විසින් කර ගෙන යනු ලබන සෑම ව්‍යාපාරයකම ගනුදෙනු පිළිබඳ වාර්තාවක් එම වාර්තාව මෙම ප්‍රඥප්තියේ 9 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලබන අදළ පිරිවැටුම පිළිබඳ වාර්තාව සමග ප්‍රතිසන්ධානයක් ඇති කරවීම පහසු කරවන යම් ආකාරයකින් පවත්වා ගෙන යා යුතු ය. වාර්තා පවත්වාගෙන යාම.

12. (1) 8 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් දිනයක හෝ ඊට පෙර යම් අදළ කාර්තුවක් සඳහා වන යම් ඛනිජ ද්‍රව්‍ය බද්දක් හෝ එම ඛනිජ ද්‍රව්‍ය බද්දෙන් යම් කොටසක් ගෙවා නොමැති විට, එම මුදල හෝ එහි යම් කොටසක් ගෙවීම පැහැර හැර ඇති බවට සලකනු ලැබිය යුතු ය. ඛනිජ ද්‍රව්‍ය බද්ද ගෙවා නොමැති විට ගෙවීම පැහැර හැර ඇති බවට සලකනු ලැබිය යුතු බව.

(2) ගෙවීම පැහැර හැර ඇති ඛනිජ ද්‍රව්‍ය බද්ද හෝ එහි යම් කොටසක්-

*(අ)* යම් පුද්ගලයකු,

*(ආ)* යම් හවුල් ව්‍යාපාරයක්,

*(ඇ)* යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක්,

විසින් ගෙවිය යුතු විට, අවස්ථාවෝචිත පරිදි, එම පුද්ගලයා, එම හවුල් ව්‍යාපාරයේ සෑම හවුල් කරුවකු හෝ එම සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් ප්‍රධාන නිළධරයකු මෙම ප්‍රඥප්තියේ කාර්ය සඳහා ගෙවීම පැහැර හරින ලද තැනැත්තකු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

13. (1) යම් ඛනිජ ද්‍රව්‍ය බද්දක් ගෙවීම පැහැර හැර ඇති විට , එම ගෙවීම පැහැර හරින ලද තැනැත්තා විසින් එම ගෙවීම පැහර හරින ලද බද්දට අමතරව දඩයක් වශයෙන් ගෙවීම පැහැර හැරීම සඳහා වන දඩය.

(අ) ගෙවීම පැහැර හරින ලද මුදලේ සියයට දහයකට සමාන යම් මුදලක් ; සහ

(ආ) එම ගෙවීම පැහැර හැරීම ආරම්භ වූ මාසයට ඉක්බිතිව ම වූ මාසයේ පහළොස්වන දිනට පෙර එම ගෙවීම පැහැර හරින ලද මුදල ගෙවා නොමැති නම් එම පැහැර හැරීම සිදුවන කාලසීමාව තුළ එක් එක් ඉක්බිතිවම වූ මාසය තුළ පහළොස්වන දිනෙන් අවසන් වන කාලසීමාව හෝ ඉන් යම් කොටසක් සඳහා එම ගෙවීම පැහැර හැර ඇති මුදලේ සියයට දෙකකට සමාන වැඩිදුර වූ මුදලක් ගෙවනු ලැබිය යුතු ය.

එසේ වුව ද, මෙම උපවගන්තිය යටතේ දඩය වශයෙන් ගෙවිය යුතු මුළු මුදල, ගෙවීම පැහැර හැර ඇති ඛනිජ ද්‍රව්‍ය බද්දෙන් සියයට පනහක් කිසිදු අවස්ථාවක නොඉක්මවිය යුතු අතර, එම පැහැර හැරීම සිදු වූ යම් විශේෂ අවස්ථානුගත කරුණු අනුව එම මුදල අත්හැරීම හෝ අඩු කිරීම සාධාරණ හා යුක්තිසහගත වන බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වන්නේ නම් එම මුදල අත්හැරීම හෝ අඩු කිරීම කළ හැකි ය.

(2) 2014 අංක 1 දරන උතුරු පළාත් මුදල් ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ යම් අභියාචනයක් පිළිබඳව ගනු ලැබූ අවසන් තීරණයක් මත (1) වන උපවගන්තිය යටතේ ගෙවීම පැහැර හැර ඇති යම් ඛනිජ ද්‍රව්‍ය බද්දක් සඳහා එකතු කරනු ලබන හෝ එකතු කරන ලද යම් මුදලක් හෝ මුදල් අඩු කරනු ලැබ ඇති විට එම මුදල හෝ මුදල් ඛනිජ ද්‍රව්‍ය බද්දෙන් එසේ අඩු කරන ලද බවට ගණනය කළ යුතු ය.

උතුරු පළාත් මුදල් ප්‍රඥප්තියේ ඇතැම් විධිවිධාන අදාළ විය යුතු බව

14. පරිපාලනය, තක්සේරු කිරීම්, අවසානාත්මක වශයෙන් සිදු කරනු ලබන තක්සේරු කිරීම් සහ වැරදි වාර්තා සඳහා වන දඬුවම්, විශේෂ අවස්ථා, දණ්ඩන සහ වැරදි, පොදු කාරණා, කොමසාරිස්වරයා වෙත කරනු ලබන අභියාචනා, සමාලෝචන මණ්ඩලය වෙත කරනු ලබන අභියාචනා, මහාධිකරණය වෙත කරනු ලබන අභියාචනා හා බදු අයකරගැනීම්, විවිධ හා අර්ථ නිරූපනය පිළිබඳ විධිවිධාන සම්බන්ධයෙන් අදල වන්නාවූ 2014 අංක 1 දරන උතුරු පළාත් මුදල් ප්‍රඥප්තියේ VI වන අධිකාරයේ 10(4), (5), (6), (7), (8), (9), (10) වන උපවගන්තිවල විධිවිධාන ඇතුළුව I, VII, IX, X, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXXIII, සහ XXXIV වන අධිකාරවල විධිවිධාන පිළිවෙලින් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මෙම ප්‍රඥප්තිය යටතේ පරිපාලනය, තක්සේරු කිරීම්, අවසානාත්මක වශයෙන් සිදුකරනු ලබන තක්සේරු කිරීම් සහ වැරදි වාර්ථා සඳහා වන දඬුවම්, විශේෂ අවස්ථා, දණ්ඩන සහ වැරදි, පොදු කාරණා, කොමසාරිස්වරයා වෙත කරනු ලබන අභියාචනා, සමාලෝචන මණ්ඩලය වෙත කරනු ලබන අභියාචනා, මහධිකරණය වෙත කරනු ලබන අභියාචනා, බදු අයකර ගැනීම, විවිධ හා අර්ථ නිරූපනය පිළිබඳ විධිවිධාන සම්බන්ධයෙන් අදල විය යුතු ය.

අර්ථ නිරූපනය.

15. මෙම ප්‍රඥප්තියේ අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇත්නම් මිස "බලපත්‍රය" යන්නෙන් 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 28 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් අදහස් වේ.

"ඛනිජ ද්‍රව්‍ය" යන්නෙන් වැලි ඇතුළුව පොළොව මතුපිටින් හෝ ඊට පහළින් සහ දියර හෝ වායු ආකාරයෙන් කැණිය හැකි යම් ස්වභාවිකව හටගන්නා ද්‍රව්‍යයක්, හයිඩ්‍රො කාබන් ඇතුළත් නොවන එහෙත් ජීර්ණක හා ලුණු ඇතුළත් වන සහ සැකසීම මගින් ලබා ගන්නා එම ඛනිජ ද්‍රව්‍යවල යම් නිෂ්පාදනයක් හා එම ඛනිජ ද්‍රව්‍ය ඇතුළත් යම් ලෝහ පසක් අදහස් වේ.

"කැණීම" යන්නෙන් යම් ඛනිජ ද්‍රව්‍ය ලබාගැනීම හෝ ඇගයීමේ කාර්යය සඳහා පොළොව මතුපිට හෝ ඊට යටින් සිදුකරනු ලබන යම් කැණීම් අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් මුදල් විෂයය පවරනු ලැබ ඇති උතුරු පළාත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා අදහස් වේ.

"කාර්තුව" යන්නෙන් යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් එම තක්සේරු වර්ෂයේ පිළිවෙලින් අප්‍රේල්, ජූලි, ඔක්තෝබර් හෝ ජනවාරි මාසවල පළමුවැනි දිනයෙන් ආරම්භ වන මාස තුනක කාලසීමාව අදහස් වේ.

"තැනැත්තා" යන්නට සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ.

"කොමසාරිස්වරයා" යන්නෙන් උතුරු පළාත් සභාවේ පළාත් ආදයම්බදු දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා අදහස් වේ.

දෙමළ භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

16. මෙම ප්‍රඥප්තියේ දෙමළ සහ සිංහල භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, දෙමළ භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

09 - 790

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.